#mediaethicsSL #EnglishPress #lka #DailyMirror

දරුවෙකුගේ පාසැල් අධ්‍යාපනයට බාධාවක් එල්ල වන අකාරයෙන් දරුවෙකුගේ අනන්‍යතාවය හෙළි කිරීම හෝ පෞද්ගලිකත්වයට සම්බන්ධ කරුණු ප්‍රකාශයට පත් කිරීම පිළිගත හැකි නොවන බව මාධ්‍ය ආචාර ධර්මයන් හි දැක්වේ. එය වෙනස් වන්නේ පොදුජන සුබසිද්ධිය සම්බන්ධ කරුණකදී පමණි.

ඩේලි මිරර් පුවත්පතේ පළවූ "සමනලයින්ට පාද නැතැයි පැවසීම නිසා විදුහල්පති විසින් දරුවෙකුට පහර දේ" යන මැයෙන් වූ ලිපියක එම දරුවාගේ සහ මවගේ රෝහලේ සිටිනා ඡායාරූප පළ කොට ඇතිවා පමණක් නොව, ඔවුන්ගේ නම් ගම්ද හෙළිදරවු කොට ඇත.

ඇතැම් විට මෙවැනි සිදුවීමක් සම්බන්ධව ප්‍රකාශය කිරීමේදී වින්දිතයින්ගේ නම් ගම් සහිතව ප්‍රකාශ කරන ලෙසින් වින්දිතයින්/භාරකරුවන් විසින් ඉල්ලා සිටීමේ ඉඩක්ද ඇති බව මෙහිදී සැලකිල්ලට ගැනීමට සිදුවේ. එසේ නමුදු, එවැනි අවස්ථාවක ඒ බව ලිපිය සමගින් සඳහන් කිරීමේ භාවිතාවක් ඇතිකර ගැනීම යෝග්‍ය නොවනු ඇතිද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?